# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# ஊவா மாகாண கல்வித் திணைக்களம்
# UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

## පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය පැය එකයි. |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.**
- **අංක 01 සිට40 0 දක්වා ප්‍රශ්න වල දී ඇති1 2 3 4 පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

---

01. ඉතිහාසය හැදෑරීමට ඉවහල් කරගත හැකි මූලාශ්‍ර කොටස් දෙකකි. ඒවා නම්,
   **(1)** සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යා මූලාශ්‍ර.  (2) දේශීය මූලාශ්‍ර හා විදේශීය මූලාශ්‍ර.
   (3) මහා වංශය හා පැරණි නටඹුන්.  (4) දේශීය මූලාශ්‍ර හා පුරාවිද්‍යා මූලාශ්‍ර.

02. ශ්‍රී ලංකාව ජනාවාස කිරීම සඳහා සම්බන්ධ වූ ආදි මානවයා වන්නේ,
   (1) හෝමෝඉරෙක්ටස්.  (2) හෝමෝහැබිලස්.
   **(3)** හෝමෝසාපියන්.  (4) හෝමෝනියැන්ඩතාල්.

03. පැරණි සෙල්ලිපිවල 'පරුමකලු'නමින හඳුන්වා ඇත්තේ කවුරුන් ද?
   (1) වැව් පාලනයට සම්බන්ධ අය.  **(2)** ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ කාන්තාවන්.
   (3) ගම් පාලනයට සම්බන්ධ අය.  (4) ගම් කීපයක් පාලනය කළ අය.

04. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණ කුසලතාව පිළිබඳ තොරතුරු අධ්‍යයන කළ හැක්කේ,
   (1) ගින්දර සොයා ගැනීම තුළින්.  (2) දුනු ඊතල මගින්.
   (3) මහා ශිලාසුසාන මගින්.  **(4)** ක්ෂුද්‍ර ගල් මෙවලම් මගින්.

05. කෙටිමුල පද්ධතියක් සහිත නියඟයට හොඳින් ඔරොත්තු දෙන බෝග වගා කරන ලද්දේ,
   (1) තෙත් බිම්වල ය.  (2) කුඹුරුවල ය.  **(3)** හේන්වල ය.  (4) කඳුකර බිම්වල ය.

06. ගමේ වැව නඩත්තු කිරීම, ඉන් ජලය බෙදාහැරීම යන කාර්යයන් අයත්වූයේ පහත සඳහන් අය අතරින් කාහට ද?
   (1) ගෘහපතිට.  (2) දසගම්ඇත්තන්ට.  (3) පරුමකට.  **(4)** ගමිකට.

07. රාජ්‍යත්වයට පත් වී දසවසරකට පසු දිවයිනේ ග්‍රාම සීමා සලකුණු කළ රජතුමා කවුද?
   **(1)** පණ්ඩුකාභය රජතුමා.  (2) දුටුගැමුණු රජතුමා.  (3) මහසෙන් රජතුමා.  (4) වසභ රජතුමා.

08. අනුරාධපුර යුගයේ වෛද්‍ය ශාස්ත්‍රය වෙනුවෙන් සේවයක් කළ රජවරු සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර වන්නේ,
   A – පණ්ඩුකාභය රජු සිවිකසාලා ඉදිකිරීම හා දුටුගැමුණු රජු රෝහල් දහයක් ඉදිකරවීම.
   B – බුද්ධදාස රජු රෝහල් ඉදිකිරීම හා V මිහිඳු රජු රෝහල්වලට සියලු දේ ලබාදීම.
   C – iV වන කාශ්‍යප රජු උන රෝගය සඳහා උපසග්ග රෝගනාසනම් රෝහල් ඉදිකිරීම හා I උපතිස්ස රජු පසවන්ති ශාලා නම් මාතෘ නිවාස සෑදීම.
   D – V වන මහින්ද රජු උපසග්ග රෝගනාසනම් රෝහල් ඉදිකිරීම හා පණ්ඩුකාභය රජු රෝහල් දයහක් ඉදිකිරීම.

   (1) A හා C  (2) B හා D  (3) B හා C  (4) D පමණි.

09. ඉන්දියානු කුලී හේවායින්ගේ සහාය පැතූ පැරණි ලංකාවේ පාලකයින් දෙදෙනෙකු වන්නේ,
   (1) ඉලනාග හා අභයනාග රජවරු ය.  (2) දේවානම්පියතිස්ස හා දුටුගැමුණු රජවරු ය.
   (3) දුටුගැමුණු හා දෙවන විජයබාහු රජවරු ය.  (4) වළගම්බා හා මහසෙන් රජවරු ය.

10. රාජ්‍යත්ව සංකල්ප ගොඩනැගී තිබෙන ආකාරය අනුව "කාලිංග චක්‍රවර්ති ස්වාමින්වහන්සේ" ලෙස තමන්ව හඳුන්වාගත් රජතුමා නම්,
   (1) කුටකණ්ණ අභය රජතුමා.  (2) කාශ්‍යප රජතුමා.
   **(3)** නිශ්ශංකමල්ල රජතුමා.  (4) 11 පරාක්‍රමබාහු රජතුමා.

11. 'වෙජ්ජසාලා'යන පදය පැරණි සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන්වේ. එයින් අදහස් කරන්නේ කුමක්ද?
   (1) ආගමික කටයුතු සිදුකරන ස්ථානයක් ගැන ය.  (2) යුක්තිය පසිඳලන ස්ථානයක් ගැන ය.
   (3) මාතෘ නිවාස ගැන ය.  **(4)** රෝහලක් ගැන ය.

12. ඉදිරියේ දක්නට ලැබෙන පිංතූරය හඳුනා ගන්න.එය ඉදිකළ රජතුමා කවුරුන්දැයි පහත නම් අතරින් තෝරන්න.
   (1) මුටසිව රජතුමා .  **(2)** දේවානම්පියතිස්ස රජතුමා.



www.edudept.up.gov.lk

(3) දුටුගැමුණු රජතුමා. (4) වළගම්බා රජතුමා.

13. ''ගල් තට්ටුව, ඒ මත බොරළු තට්ටුවද නැවත පළිඟු ගල් තට්ටුවක්ද අතුරා රසායන ද්‍රව්‍යයකින් දිකර ගන්නා ලද දිවුල් මැලියම් තවරා ලෝහ දැලක් එලා ........'' ආදී වශයෙන්ම හා වංශයේ දැක්වෙන්නේ කවර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ද?

(1) රුවන්වැලිසෑය. (2) ලෝවාමහාපාය. (3) ථූපාරාමය. (4) ජේතවනාරාමය.

14. උස්බිම්වල ස්වාභාවික වනාන්තර කපාබිම හෙළීමෙන් පාංශුඛාදනය හා නායයාම සිදුවිය හැකිබව පෙන්වා දෙමින් උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කළ රජතුමා කවුද?
(1) V වන කාශ්‍යප රජතුමා. (2) IV මිහිඳු රජතුමා.
(3) අමණ්ඩ ගාමිණී රජතුමා. (4) III වන උදය රජතුමා.

15. A තීරුවට අදාළ පිළිතුර B තීරුවෙන් තෝරා යා කළ විට ලැබෙන නිවරදි පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1) | අඩික | A | නගර වාස්තු විද්‍යා ශිල්පි |
| 2) | ආංගුලය | B | වැව් වල ජලය භාවිත කළ අයගෙන් අය කළ බද්ද |
| 3) | නගරවඩ්ඩකි | C | ඇළ මාර්ග සම්බන්ධව කටයුතු කළ තැනැත්තා |
| 4) | දකපති | D | කෙටිදුර මනින ඒකකය |

(1) CDAB (2) ADBC (3) DCAB (4) BCDA

16. දියාරු නොවූ අතින් ගෙන අනුභව කළහැකි පදමට සකස් කරගත් ව්‍යංජනය හඳුන්වන්නේ,
(1) යාගු නමිනි. (2) කටුක භාණ්ඩ නමිනි. (3) නියඹලාව නමිනි. (4) ඇඹුල්හඹු නමිනි.

17. සංවිධානාත්මක සටන් ව්‍යාපාරයකට නායකත්වය සපයමින්, සහජීවනයේ අගය ලොවට පෙන්වා දුන් ශ්‍රේෂ්ඨ රජතුමා
(1) මහා විජය බාහු ය. (2) මහා පරාක්‍රමබාහු ය. (3) නිශ්ශංකමල්ල ය. (4) දුටුගැමුණු ය.

18. ක්‍රි. ව. 1215 දී විශාල හමුදාවක් සමඟ දකුණු ඉන්දියාවෙන් මෙරටට පැමිණි ආක්‍රමණිකයා කවු ද?
(1) සේන ගුත්තික. (2) එළාර. (3) කාලිංග මාඝ. (4) ජාවක චන්ද්‍රභානු

19. ගම්පොළ රාජධානි සමයට අයත් සිදුවීම් පහත කරුණු අතරින් තෝරන්න.
A - ආර්ය චක්‍රවර්ති පාණ්ඩ්‍ය හමුදාවක් සමඟ ලංකාව ආක්‍රමණය කිරීම.
B - ඉබන් බතුතා ලංකාවට පැමිණීම.
C - සතර කෝරලයේ සිටි අම්බුළුගල කුමාරයා බලයට පත්වීම.
D - සේනාධිලංකාර සෙනෙවිරත් ධූරය දැරීම.
(1) A හා B (2) B හා D (3) A හා D (4) C හා D

- **පහත වගුවේ තොරතුරු ඇසුරින් 20 හා 21 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| මව්රට | ලංකාවට පැමිණි පළමු පුද්ගලයා | ඒ වනවිට ලංකාවේ සිටි පාලකයා |
|---|---|---|
| A - පෘතුගාලය | D - ජෝන් පයිබස් | G - කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| B - ඕලන්දය | E - ලොරෙන්සෝ ද අල්මේදා | H - I විමලධර්මසූරිය රජු |
| C - එංගලන්තය | F - ජොරිස්වැන් ස්පිල්බර්ජන් | J - viii වන වීර පරාක්‍රමබාහු රජු |

20. ලොරෙන්සෝ ද අල්මේදාගේ මව්රට හා ඔහු පැමිණෙන විට ලංකාවේ සිටි පාලකයා දැක්වෙන අක්ෂර මොනවා ද?
(1) A හා J (2) A හා G (3) B හා H (4) C හා H

21. එංගලන්තයෙන් පැමිණි පුද්ගලයා හා ඔහු හමු වූ පාලකයා දැක්වෙන අක්ෂර මොනවා ද?
(1) F හා H (2) D හා G (3) E හා G (4) D හා J

22. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතුවක් නොවන්නේ,
(1) කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත්වීම. (2) වංශාධිපතිවරු තම ඉඩම් ගොවියන්ට ලබාදීම.
(3) පල්ලියේ ආධිපත්‍ය විවේචනයට ලක්වීම. (4) යුරෝපය තුළ බුද්ධි ප්‍රබෝධයක් ඇතිවීම.

23. රුධිරය හදවතේ දකුණු කෝෂයෙන් පිට වී පෙනහළු මගින් පිරිසිදු වී නැවත හදවතට පැමිණ ශරීරය පුරා විසිර යන බව සොයාගත් විද්‍යාඥයානම්,
(1) විලියම්හාවේ. (2) පැරසල්සස්
(3) මයිකල් සර්ටෙස්. (4) ඇලෙක්සැන්ඩර් ප්ලෙමිං.

24. ලංදේසින්ට අයත්ව තිබූ කුළුබඩු දිවයිනකට ක්‍රි. ව.1623 දී ඉංග්‍රීසීන් විසින් පහර දෙන ලදී. එම දිවයින කුමක් ද?
(1) ලංකාව (2) ජාවා (3) සුමාත්‍රා (4) ඇම්බොයිනා

25. ක්‍රි.ව. 1795 දී උඩරට පාලකයාව සිටි රාජාධිරාජසිංහ හමුවීමට ගිය ඉංග්‍රීසි ජාතිකයා
(1) රොබට්නොක්ස් ය. (2) රොබට්ඇන්ඩෲස් ය. (3) හියුබොයිඩ් ය. (4) ජෝන්පයිබස් ය.

- **පහත සඳහන් ප්‍රකාශ කියවා 26 හා 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - ක්‍රි.ව. 1840 පනවන ලද මුඩු ඉඩම් පනත අනුව වගා නොකළ ඉඩම් රාජසන්තක කිරීම.
B - ඇඟ බද්ද හෙවත් පාර බද්ද පැනවීම.
C - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා ගම් සභා අඩපනවීම.

www.edudept.up.gov.lk


D - වාරි කර්මාන්තය සඳහා අනුග්‍රහය දැක්වීම.
E - නිල්පොත නම් සංඛ්‍යාලේඛන සංග්‍රහය සඳහා තොරතුරු රැස්කිරීම.

26. ඉහත ප්‍රකාශවලට අනුව කෝල්බෲක් ප්‍රතිසංස්කරණයන්ට අදාල ප්‍රකාශ වන්නේ,
**(1)** A හා C (2) B හා C (3) C හා E (4) A හා B

27. ටොරින්ටන් සාමිවරයාගේ කාල වකවානුව තුළ සිදුවූ ක්‍රියාදාමයන් දෙකක් ඉහත ප්‍රකාශයන් අතරින් තෝරන්න.
(1) B හා E (2) A හා B (3) B හා C (4) C හා E

28. පහත සඳහන් ප්‍රකාශයන් අධ්‍යයනය කොට කාර්මික විප්ලවයේ යහපත් ප්‍රතිඵලයන් දැක්වෙන ප්‍රකාශ තෝරන්න.
A - නව අධිරාජ්‍යවාදයක් ඇතිවීම. B - ශ්‍රමය අඩු මිලට ලබාගත හැකිවීම.
C - නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළයාම. D - දැරිය හැකි මිලකට භාණ්ඩ ලබාගත හැකිවීම.
(1) A හා C (2) B හා C **(3)** Cහා D (4) B හා D

29. ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබූ පානදුරාවාදයේ නායකත්වය ගත් භික්ෂූන් වහන්සේ මේ පිංතූරයෙන් දැක්වේ. උන්වහන්සේ කවුරුන්දැයි සඳහන් කරන්න.



(1) වාරියපොළ ශ්‍රී සුමංගල හිමි. (2) සරණංකර සංඝරාජ හිමි.
**(3)** මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි. (4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි.

30. පහත සඳහන් නායකයන් අතරින් නාගරික කම්කරුවන් හා වතු කම්කරුවන් නියෝජනය කරන වෘත්තිය සංගම් වල නායකත්වය දැරූ නායකයන් ඇතුළත් පිළිතුර තෝරන්න.
A - ඒ.ඊ. ගුණසිංහ B - වලිසිංහ හරිශ්චන්ද්‍ර
C - ආතර් වීදියෙස් D - නටේසර් අයියර්
(1) A හා B (2) B හා C (3) C හා D **(4)** A හා D

- **අංක 31 32 33 ප්‍රශ්න සඳහා හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.**

31. සිංහල බෞද්ධයා හා මහාබෝධි සඟරාවට සැපයූ ලිපි තුලින් ..................................................... දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීම සඳහා ක්‍රියා කළේය.
(1) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා. (2) ආනන්ද රාජකරුණා මහතා.
(3) පියදාස සිරිසේන මහතා. (4) අනගාරික ධර්පාල තුමා.

32. ඇමෙරිකාවේ නිදහස් සටනින් පසු ලෝකයේ ප්‍රථම ලිඛිත ..................................ව්‍යවස්ථාව බිහිවන්නේය.
**(1)** සංධීය ආණ්ඩුක්‍රම. (2) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම.
(3) සමාජවාදී ආණ්ඩුක්‍රම. (4) ධනවාදී ආණ්ඩුක්‍රම.

33. 1952 දී මෙරටට පැමිණි ..............................නියෝජිත කණ්ඩායමක් රජයේ මැදිහත් වීම මත සුළු හා මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්ත ආරම්භ කිරීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී.
(1) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ. **(2)** ලෝක බැංකු.
(3) සාර්ක් සංවිධානයේ විදේශීය (4) යුනෙස්කෝ.

- **පහත A, B, C, D යටතේ දැක්වෙන ප්‍රකාශ යුගලයන් අධ්‍යයනය කර 34, 35, 36, 37 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A. 1 වර්සෙල්ස් ගිවිසුම.
2 පළමු ලෝක සංග්‍රාමය.
B. 1 ප්‍රංශ විප්ලවය ඇතිවීම.
2 නීතියේ සාරය කෘතිය එළි දැක්වීම.
C. 1 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.
2 ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කිරීම.
D. 1 විධායක ජනාධිපති ක්‍රමය.
2 සමානුපාතික නියෝජන ක්‍රමය.

34. පළමුවැන්න ඇති වීම සඳහා දෙවැන්නේ බලපෑමක් ඇතිවීම දැක්වෙන යුගලය.
(1) A ය. **(2)** B ය. (3) C ය. (4) D ය.

35. දෙවැන්නේ ප්‍රතිඵලයක් ලෙස පළමු වැන්න ඇතිවීම දැක්වෙන යුගලය.
(1) D ය. (2) C ය. **(3)** A ය. (4) B ය.

36. එකිනෙකට කිසිඳු සම්බන්ධයක් නොදක්වන යුගලය.
**(1)** D ය. (2) A ය. (3) C ය. (4) B ය.

37. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න ඇති වීම දැක්වෙන යුගලය.
(1) B ය. (2) A ය. (3) C ය. (4) D ය.

- **පහත A හා B ප්‍රකාශ කියවා 38 හා 39 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**A** - නෝට්ටු පනත නිසා රිදී රන් වලින් මුදල් ගෙවීමට සිදුවීම.
**B** - කර්මාන්ත ශාලා, බැංකු ගමනාගමනය ජනසතු කිරීම.

38. ඇමෙරිකන් විප්ලවය සම්බන්ධයෙන් ,
(1) A හා B සත්‍යවේ. (2) B සත්‍ය වන අතර A අසත්‍ය වේ.
(3) A හා B අසත්‍යවේ. **(4)** A සත්‍ය වන අතර B අසත්‍ය වේ.

39. රුසියන් විප්ලවය සම්බන්ධයෙන් ,
**(1)** B සත්‍ය වන අතර A අසත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.

www.edudept.np.gov.lk

(3) A හා B සත්‍යවේ. (4) A හා B අසත්‍යවේ.

40. දෙවැනි ලෝක යුධ සමයේ ජපානයට යටත් කර ගැනීමට නොහැකිවූ ආසියාතික රට කුමක්ද?

(1) සිංගප්පූරුව (2) මැලේසියාව (3) පිලිපීනය (4) ලංකාව

